**විසර්ජන ශිර්ෂය 173 - රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය**

**විගණකාධිපති වාර්තාව -2012**

## 1.1 විගණන විෂය පථය

රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ජනවාරි 13 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනිම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

(i) අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලිනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛණය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. |
| අලාභ හානි ලේඛණය | මුදල් රෙගුලාසි 110 |

(ආ) **විසර්ජන ගිණුම**

(i) **මුළු ප්‍රතිපාදනය හා වියදම**

සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.186,050,000 ක් වූ අතර වර්ෂය අවසාන වන විට ඉන් රු.99,887,011 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු.86,162,989 ක් වී තිබුණු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 46.3 ක ප්‍රමාණයක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 86,050,000 | 86,050,000 | 22,331,683 | 25.95 |
| මූලධන | 100,000,000 | 100,000,000 | 63,831,306 | 63.83 |
| **එකතුව** | 186,050,000 | 186,050,000 | 86,162,989 | 46.31 |

-------------------------------------------------------------------------------------------------------------------------------

**(ii) ප්‍රතිපාදන ඉතිරිවීම්**

-------------------

- වැය විෂයයන් 05 ක් සඳහා සලසා තිබුණු රු.6,200,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

- 2011දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව ප්‍රතිපාදන අවුරා තැබීමෙන් පසුවද වැය විෂයයන් 18 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.75,099,495 වූ අතර එය එම වැය විෂයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 26 ත් සියයට 93 ත් අතර පරාසයක ගෙන තිබුණි.

(ඇ) **අග්‍රිම ගිණුම්**

------------

අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දින වන විට රු.1,993,712 ක් වූ අග්‍රිම හර ශේෂ යක් තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 371(2)(ඇ) හි සඳහන් විධිවිධානයන්ට පටහැනි ලෙස මාණ්ඩලික නොවන නිලධාරීන් 11 දෙනෙකුට අවස්ථා 57 කදී එකතුව රු.452,350 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 371(2)(ඇ) ප්‍රකාරව කාර්ය නිම කළ වහාම ලබා ගත් තත් කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, කාර්ය නිම වී දින 74 ක ප්‍රමාදයකින් පසුව අතුරු අග්‍රිමය නිරවුල් කර තිබුණි.

(iii) මුදල් රෙගුලාසි 371(2)(ආ) ප්‍රකාරව එක් මාණ්ඩලික නිලධාරියෙකු වෙත එක් වරකදී නිකුත් කළ හැකි උපරිම තත් කාර්ය අතුරු අග්‍රිමය රු. 20,000 ක් වුවත් එම විධිවිධානවලට පටහැනිව අවස්ථා 12 කදී නිලධාරීන් 08 දෙනෙකු වෙත රු.20,000 ක් ඉක්මවූ එකතුව රු.536,000 ක තත් කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

**1.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**1.4.1 සංයුක්ත සැලැස්ම**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් , දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලස්මක් අමාත්‍යාංශය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කල යුතු වුවත්, එම සැලැස්ම පිළියෙල කර තිබුණේ 2012 අගෝස්තු 23 දින දීය.

**1.4.2 වාර්ෂික කාර්යසාධන වාර්තා**

ඉහත 1.4.1 ඡේදයෙහි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත අමාත්‍යාංශය විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව 2013 දෙසැම්බර් 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**1.4.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැත අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලස්ම පිළියෙල කර තිබුණේ 2012 මාර්තු 06 දින දීය.

**1.5 අනුකූල නොවීම්**

(අ) **නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව. | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(i) මුදල් රෙගුලාසි** | | |
| මු.රෙ. 104 (3) | - | වාහන අනතුරු පිළිබඳව පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07 කට වැඩි ප්‍රමාදයන් සිදුවන අවස්ථාවක ප්‍රාරම්භක වාර්තාවක් ඉදිරිපත් කල යුතු අතර, අලාභ හානිය සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළතදී පූර්ණ වාර්තාවක් ඉදරිපත් කල යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ සිදු වූ අනතුරු 10 සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |
| **(ii) ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ** | | |
| 2010 මැයි 14 දිනැති අංක CA/1/17/1 දරන චක්‍රලේඛයේ 01 ජේදය | 275,000 | අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින ආයතනයන්හි කාර්යාල හැකිතාක් දුරට රජයේ හෝ සංස්ථා වලට අයත් ගොඩනැගිලි වල පවත්වා ගත යුතු වුවත්, ඊට අනුකූල නොවී අමාත්‍යාංශය විසින් නුවරඑළිය ව්‍යාපෘති කාර්යාලය වෙනුවෙන් බාහිර කුලී ගොඩනැගිල්ලක් ලබාගෙන තිබුණි. |
| **(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | - | සෑම මාස 06 කට වරක් වාහන වල ඉන්ධන දැවීම පරික්ෂා කල යුතු වුවත් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |

## 1.7 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2012 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 09 | 09 | - |
| (ii) | ද්විතියක මට්ටම | 60 | 32 | 28 |
| (iii) | ප්‍රාථමික මට්ටම | 20 | 12 | 08 |
| | එකතුව | 89 | 53 | 36 |

සමාලෝචිත වර්ෂය අවසානයට කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 36 ක් සම්පූර්ණ කල යුතුව තිබුණි.